# කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

# පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය

## සමාජීය විද්‍යා පීඨයේ පශ්චාත් උපාධි පාඨමාලා - - 2011

**ශාස්ත්‍රපති (MA) උපාධි පාඨමාලා (එක් අවුරුදු)**

**සමාජීය විද්‍යාපති (MSSc) පාඨමාලා (දෑවුරුදු පර්යේෂණ)**

කැලණිය විශ්වවිද්‍යාලයේ, සමාජීය විද්‍යා පීඨය යටතේ ශාස්ත්‍රපති (එක් අවුරුදු) සහ සමාජීය විද්‍යාපති (දෑවුරුදු පර්යේෂණ) උපාධි පාඨමාලා සඳහා අයදුම්පත් නිකුත් කිරීම **2011.07.29** දින දක්වාද සම්පූර්ණ කරන ලද අයදුම්පත් භාරගැනීම **2011.08.10** දින දක්වාද කරනු ලැබේ. උක්ත පාඨමාලා 2011 වර්ෂයේ අගෝස්තු මස ආරම්භවීමට නියමිතය.

**විෂයයන්**

අයදුම්පත් කැඳවනු ලබන්නේ ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, ජනසන්නිවේදනය, දේශපාලන විද්‍යාව, භූගෝල විද්‍යාව, පුස්තකාල හා විඥාපන විද්‍යා, ඉතිහාසය, පුරාවිද්‍යාව සහ දර්ශනය යන විෂයයන්ට අදාළ පාඨමාලා සඳහා පමණි.

**සුදුසුකම්**

ශාස්ත්‍රපති **(MA)** (එක් වසරකි)

පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය සහිතව ලබාගත් ශාස්ත්‍රවේදී (විශේෂ හෝ සාමාන්‍ය) උපාධිය හෝ සනාතන සභාව විසින් පිළිගනු ලබන ඊට සමාන අධ්‍යයන හෝ වෘත්තීය සුදුසුකම් ලබා තිබීම.

**සමාජීය විද්‍යාපති පාඨමාලාව (MSSc)**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂයට පන්ති සාමාර්ථ්‍යය සහිතව ලබාගත් ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය හෝ සනාතන සභාව විසින් පිළිගනු ලබන ඊට සමාන අධ්‍යයන හෝ වෘත්තීය සුදුසුකම් ලබා තිබීම.

පුස්තකාල හා විඥාපන විද්‍යාව සඳහා පමණක් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් (විශේෂ හෝ සාමාන්‍ය) උපාධියක් සහ පිළිගත් පුස්තකාලයක මාණ්ඩලික තත්ත්වයේ එක් වසරක පළපුරුද්ද හෝ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් (විශේෂ හෝ සාමාන්‍ය) උපාධියක් සහ කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව උසස් සහතික පත්‍ර පාඨමාලාව හෝ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අවසන් පරීක්ෂණය සමත්වීම.

**පාඨමාලා සඳහා තෝරාගැනීම**

අදාළ අධ්‍යයන අංශ මගින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදු කරන අතර උපරිම සුදුසුකම් ඇති අපේක්ෂකයින් සඳහා ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

**පාඨමාලා ගාස්තු**

| පාඨමාලාව | |
|---|---|
| ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා (MA) + පුස්තකාල ගාස්තු (ආපසු ගෙවනු ලබන) | රු. 55,000.00 + රු. 5000.00 |
| සමාජීය විද්‍යාපති පාඨමාලාව සඳහා (MSSc) +පුස්තකාල ගාස්තු (ආපසු ගෙවනු ලබන) | රු. 65,000.00 + රු. 5000.00 |

**පාඨමාලා අයදුම්පත්**

කැලණිය මහජන බැංකුවේ අංක **055---1-001-10667549** දරණ එකතු කිරීමේ ගිණුමට රු. 300.00 මුදලක් (තුන් සීයක්) ගෙවූ රිසිට්පතක්, සහකාර ලේඛකාධිකාරී/පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු පාඨමාලා අයදුම්පත සහ විස්තර පත්‍රිකාව ලබාගත හැකිය.

අයදුම්පත් තැපෑලෙන් ඉල්ලුම් කිරීමේදී එම ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ **"සමාජීය විද්‍යා පීඨ ශාස්ත්‍රපති/සමාජීය විද්‍යාපති පාඨමාලා අයදුම්පත් ලබාගැනීම"** යනුවෙන් සඳහන් කළ යුතුය. කැලණිය මහජන බැංකුවේ අංක **055--1001-10667549** දරණ එකතු කිරීමේ ගිණුමට රු. 300.00 ක මුදල ගෙවූ රිසිට්පත සමග ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය ලියන ලද රු. 5.00 ක් වටිනා මුද්දර ඇලවූ "9 x 4" ප්‍රමාණයේ කවරයක් **"සහකාර ලේඛකාධිකාරී, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය"** යන ලිපිනයට එවිය යුතුය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2011.08.10** දින හෝ ඊට පෙර ලැබෙන සේ ඉහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ඉහළ වම් කෙළවරේ **" සමාජීය විද්‍යා පීඨ ශාස්ත්‍රපති/සමාජීය විද්‍යාපති පාඨමාලා අයදුම්පත"** යනුවෙන් සඳහන් කළ යුතුය.

අයදුම්පත් නිකුත් කරනු ලබන්නේ සතියේ දිනවල කාර්යාල වේලාවන්වලදී පමණක් වන අතර අසම්පූර්ණ හා /හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේඛකාධිකාරී,

කැලණිය විශ්වවිද්‍යාලය

2011.07.12

University of Kelaniya
Faculty of Graduate Studies
Postgraduate Degree Programmes
Faculty of Social Sciences – 2011

**Master of Arts (MA) Duration 1 Year**

**Master of Social Sciences (MSSc) Duration 2 Years (Research)**

Applications are invited for the above degree courses from prospective candidates. Degree programmes will be commenced in August 2011.

Application forms will be issued until **29-07-2011** and completed application forms will be accepted until **10.08.2011.**

## Subjects

Economics, Sociology, Masscommunication, Political Science, Geography, Library and information Science, History, Archeology, and Philosophy.

## Eligibility

### Master of Arts (MA) – Duration 1 year

Should possess a Bachelor's degree (General /special) from a recognized university with relevant subject **or** any other academic or professional qualification accepted by the Senate of the University of Kelaniya.

### Master of Social Sciences (MSSc) Duration 2 years

Should possess Bachelor's degree (Special) with a class from a recognized university with relevant subject **or** any other academic or professional qualification accepted by the senate of the University of Kelaniya.

## Library & Information Science

Should possess a Bachelor's degree (General/Special) from a recognized university & one (01) year experience (Staff category) in a recognized library

**Or**

A Bachelor's degree (General/Special) & Higher Diploma certificate in Library & information Science University of Kelaniya or pass in the Final examination of the Sri Lanka Library Association.

## Selection of candidates

By an interview conducted by the relevant Department of study. Preference will be given to those who have the maximum qualifications.

**Course Fees -**

| **Degree Programme** | |
|---|---|
| Master of Arts MA + Refundable Library Fees | Rs. 55,000.00 + Rs.5000.00 |
| Master of Social Sciences + Refundable Library Fees | Rs. 65,000.00 + Rs.5000.00 |

## Applications

Application forms & other details of the programmes can be obtained by paying Rs. 300.00 to the collection account no. 055-1001100667549 of People's Bank, Kelaniya Branch and submitting the bank slip. To obtain by post send the bank slip with a self addressed envelope, affixed Rs. 50 stamps, to the **"Assistant Registrar, Faculty of Graduate Studies, University of Kelaniya, Kelaniya" o**n the top left corner of your envelope mention" MA/MSSc application forms".

## Filled Applications

Should be sent on or before 10-08-2011 to reach the above address.

## Issue of Applications

Applications will be issued during the office hours of week days only. Incomplete or delayed applications will be rejected.

Registrar,

University of Kelaniya

12-07-2011